මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: BD/NSLE/103/DMD/09/2025
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2026-01-08

**අයවැය චක්‍රලේඛ අංක 08/2025(ii)**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්

**ආපදාවෙන් විනාශ වූ යටිතල පහසුකම් නැවත ගොඩනැගීම සහ ජන ජීවිතය යථාවත් කිරීම සඳහා 2026 වර්ෂයට අමතර ප්‍රතිපාදන සලසාදීම**

අයහපත් කාලගුණික තත්ත්වය නිසා පැන නැගුණු හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් ව්‍යසනයට පත් ප්‍රදේශ නැවත නගා සිටුවමින් අඩපනව ඇති දෛනික ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම, බලපෑමට ලක්වූවන් සවිබල ගැන්වීම හා හානි වූ යටිතල පහසුකම් කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වියදම් දැරීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා දෙමින් රු. බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් 2025.12.19 වන දින පාර්ලිමේන්තුව විසින් අනුමත කර තිබේ.

02. 2026 වර්ෂයේ වියදම් දැරීම සඳහා අනුමත කරන ලද 2025 අංක 23 දරන විසර්ජන පනතෙහි ඇතුළත්ව ඇති ප්‍රතිපාදනවලට අමතරව ආපදාවෙන් හානි වූ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සහ ජන ජීවිතය යථාවත් කිරීම සඳහා මෙම ප්‍රතිපාදන ලබා දෙනු ඇත.

03. "ශ්‍රී ලංකාව නැවත ගොඩනැගීම, ආපදා තත්ත්වයට ප්‍රතිචාර වශයෙන් රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා මාර්ගෝපදේශය" යන ශීර්ෂයෙන් භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කළ අංක NP/ENM/DIM/PDNA/2025 දරන 2025.12.30 දිනැති මාර්ගෝපදේශය අනුව කටයුතු කර ඔබ ආයතනයේ විෂය පථයට ගැනෙන හානි වූ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණ සහ නැවත ඉදිකිරීම සඳහා වන රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති වෙනුවෙන් 2026 වර්ෂයට අවශ්‍ය අමතර ප්‍රතිපාදන, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා ගැනීමෙන් පසුව මෙම චක්‍රලේඛයේ ඇමුණුම 01 ආකෘතිය මඟින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලුම් කළ යුතුය.

04. ඉහත මාර්ගෝපදේශය මඟින් ආවරණය නොවන, ආපදා තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක්වූ ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම සඳහා වූ සියළුම දීමනා සහ වන්දි ගෙවීම් වෙනුවෙන් 2026 වර්ෂයට අවශ්‍ය ප්‍රතිපාදන, අදාළ දීමනාව/වන්දිය ගෙවීමට ප්‍රතිපාදන සලසා ගත යුතු අමාත්‍යාංශය / ආයතනය විසින් මෙම චක්‍රලේඛයේ ඇමුණුම 02 ආකෘතිය මඟින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් කඩිනමින් ඉල්ලුම් කළ යුතුය.

05. ඉහත ඇමුණුම් 01 සහ 02 පහත QR කේතය මඟින් ද බාගත කළ හැකිය.

**ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම**
**භාණ්ඩාගාර ලේකම්**

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. සභාපති, මුදල් කොමිෂන් සභාව
5. විගණකාධිපති

## ආපදාවෙන් හානියට පත් යටිතල පහසුකම් පුනරුත්ථාපනය / නැවත ඉදිකිරීම (රාජ්‍ය ආයෝජන ස්වභාවයේ)

| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව/ ආයතනය | ව්‍යාපෘතිය/ වැඩසටහන/ කොන්ත්‍රාත් පැකේජයේ නම | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව නිර්දේශ කළ දිනය | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව නිර්දේශ කළ මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මිලියන) | 2026 වර්ෂයේ මුළු ප්‍රතිපාදන අවශ්‍යතාවය (රු.මිලියන) | 2026 වර්ෂයට අවශ්‍ය මුළු ප්‍රතිපාදන ප්‍රමාණයෙන්, 2026 අයවැය ඇස්තමේන්තු තුළ සලසා ඇති ප්‍රතිපාදනවලින් කළමනාකරණය කර ගත හැකි ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මිලියන) | 2026 වර්ෂය සඳහා අවශ්‍ය අතිරේක ප්‍රතිපාදනය (රු.මිලියන) | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අපේක්ෂිත මාසය | ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත වර්ෂය සහ මාසය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

**අමාත්‍යාංශ ලේකම්වරයාගේ / පළාත් සභා ප්‍රධාන ලේකම්වරයාගේ නිර්දේශය :**

ඇමුණුම II

## ආපදාවෙන් බලපෑමට ලක් වූවන් සඳහා දීමනා සහ වන්දි ගෙවීමට ප්‍රතිපාදන අවශ්‍යතාවය

| ප්‍රතිපාදන ලබා දිය යුතු අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / ආයතනය[1] | දීමනාවේ නම[2] | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 2026 වර්ෂය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන (රු.මිලියන) |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අමාත්‍යාංශ ලේකම්වරයාගේ / පළාත් සභා ප්‍රධාන ලේකම්වරයාගේ නිර්දේශය :

1. අයවැය චක්‍රලේඛ අංක 08/2025 ඇමුණුම I හි සඳහන් ප්‍රතිපාදන සලසා දෙන වැය ශීර්ෂය අනුව ඉල්ලුම් කළ යුතුය

2. අයවැය චක්‍රලේඛ අංක 08/2025 , 08/2025(i) සහ ආපදාවෙන් බලපෑමට ලක්වූවන් සඳහා වන්දි / දීමනා ගෙවීමට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණ අනුව හිමි ගන්වනු ලබන දීමනා